**ශීර්ෂය 002 - අග්‍රාමාත්‍ය කාර්යාලය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ශීර්ෂය 002 අග්‍රාමාත්‍ය කාර්යාලයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව අග්‍රාමාත්‍ය කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 30 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11 (2) වගන්තිය ප්‍රකාරව කාර්යාලයට අදාල වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 ජූලි 07 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට අග්‍රාමාත්‍ය කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීන්ගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන

සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී .

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී .

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

### 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඇ) වගන්තිය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වන බවට මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| | විගණන නිරික්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 වර්ෂය තුල අවස්ථා 17 කදී දරන ලද රු.70,948,731 ක පුනරාවර්ථන වියදම් නිවැරදි වැය විෂයන් තුළ ඇතුළත් නොකර 002-1-1-0-1409 (වෙනත්) වැය | අග්‍රාමාත්‍ය කාර්යාල කටයුතු මනා සම්බන්ධීකරණය කිරීම සඳහා පමණක් 1402 වැය විෂය යටතේ දුරකථන හා තැපැල් ගාස්තු භාවිතා කොට වැය දරා ඇති බවත් එයට පරිබාහිර වූ ගරු | වියදම නිවැරදි වැය විෂය හඳුනාගෙන ගිණුම්ගත කළ යුතු වීම. |

විෂය යටතේ සටහන් කර තිබූ බව නියැදි පරීක්ෂාවේ දී නිරීක්ෂණය විය.

අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් අරලියගහ මන්දිරයේ විවිධ රැස්වීම් හා සාකච්ඡා සඳහා සන්නිවේදන උපකරණ කුලී පදනම මත ලබා ගත් බවත් ඒ සඳහා වැය වූ මුදල් 1409 වැය විෂය යටතේ ද

අනුමත කාර්ය මණ්ඩල නිලධාරීන්ට අනුමත කර ඇති සීමාවන් තුළ ලබා දෙන නිල ඇඳුම් හා ආහාරපාන වියදම් 1203 වැය විෂය භාවිතා කර ගිණුම් තැබීම සිදු කළ බවත් ගරු අග්‍රාමාත්‍යතුමාගේ හා විවිධ ප්‍රභූන් හා රාජ්‍ය තාන්ත්‍රිකයන් අග්‍රාමාත්‍යතුමා හමුවන අවස්ථාවලදී සහ උත්සව සංවිධාන වලදී ආහාරපාන හා සංග්‍රහ කටයුතු සඳහා වැයවූ වියදම් 1409 වැය විෂය යටතට ගිණුම් ගත කර ඇති බවද, මේ හා සමාන ආකාරයේ වියදම් සඳහා වාර්ෂික අයවැය ඇස්තමේන්තු සකස් කිරීමේදී මෙන්ම අමතර ප්‍රතිපාදන ඉල්ලුම් කිරීමේදී 1409 වැය විෂය යටතේ මහා භාණ්ඩාගාරයෙන් ප්‍රතිපාදන ලබා ගෙන වියදම් දරා ඇති බවත්,

ගොඩනැගිලි හා ඉදි කිරීම් කාර්යයන් යටතට නොගැනෙන CCTV පද්ධතියට අදාළ සේවා, ඡායා පිටපත් යන්ත්‍ර සඳහා සේවා, විදුලි සෝපාන සේවා, විදුලි ජනක සේවා වලට අදාළ සේවා ගිවිසුම් සඳහා වැය කරනු ලබන මුදල් වාර්ෂික අයවැය ඇස්තමේන්තුවේ සේවා ගණයේ වියදම් යටතේ වූ 1409 වැය විෂය යටතේ ගිණුම් ගත කර ඇති බවත්,

Bath Tub අලුත්වැඩියාව/Electric Cable Hoist Machine අළුත්වැඩියා වියදම් හඳුනා ගැනීම දෝෂයක් මත 1409 වැය විෂයය ගිණුම්ගත වී ඇති බවත් ඉදිරියේදී මෙවැනි වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කිරීමට නිලධාරීන්ට උපදෙස් ලබා දුන් බවත් දන්වා තිබුණි.

| | | |
|---|---|---|
| (ආ) විදුලි හා ජල බිල්පත් සඳහා දරන ලද වියදම් රු.8,278,004 ක් 002-1-1-0-1403 (ජල විදුලි බිල්පත්) වැය විෂයයට ඇතුළත් නොකර වෙනත් වැය විෂයයන් 2 ක් යටතේ ගිණුම්ගත කර තිබුණි. | 2022 වර්ෂයේදී කාර්තු පදනමින් වෙන්කර වියදම් දරණ ලෙස උපදෙස් ලබාදී තිබූ බවත්, අග්‍රාමාත්‍ය කාර්යාලයේ විෂය පථය අනුව විශේෂ රාජකාරී පවරනු ලබන හෙයින් ද භාණ්ඩ හා සේවාවල මිල ගණන් ඉහලයාම හේතුවෙන් කාර්තුවට අදාල ප්‍රතිපාදන සීමාව කාර්යාල කටයුතු අඛණ්ඩව පවත්වා ගෙන යාම සඳහා ප්‍රමාණවත් නොවූ බවත්, විදුලි හා ජල බිල්පත් නියමිත කාල පරාසය තුල නොගෙවීම නිසා විසන්ධි වී ආයතනයේ කටයුතු බිඳ වැටීමට වැළැක්වීම සඳහා ප්‍රතිපාදන පැවති පුනරාවර්ථන වැය විෂයකින් අදාළ වියදම දරා ඊළඟ කාර්තුවේ නිවැරදි වැය විෂයට ගිණුම් ගත කිරීම සිදු කල යුතු වුවද, පෙන්වා දී ඇති වියදම සිගාස් පද්ධතිය මගින් ගිණුම් ගත කිරීමට අතපසු වී ඇති බවත් ඉදිරියේදී මෙවැනි තත්වයක් ඇති නොවන ලෙස කටයුතු කිරීමට සටහන් කර ගත් බවත් නිලධාරීන්ට උපදෙස් ලබාදුන් බවත් දන්වා තිබුණි. | වැය ලෙජරයේ ගනුදෙණු සටහන් කර යාවත්කාලීනව පවත්වා ගත යුතු වීම. |

**2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 දෙසැම්බර් 13 දිනැති අංක 2022/05 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 3.3 ඡේදයේ සඳහන් පරිදි වාර්තාකරණ ආයතනයේ ඇති බැඳීම් හා බැරකම් 2022 දෙසැම්බර් 31 දිනට බැඳීම් අංක අනුව හෙළිදරව් කළ යුතු වුවද, දෙපාර්තමේන්තුවේ එකතුව 1,390,406 ක්වූ බැඳීම් හා බැරකම් මූල්‍ය ප්‍රකාශනවල ඇමුණුම් අංක | මු.රෙ. 115 (125) ඡේදය ප්‍රකාරව පූර්ව මුදල් වර්ෂ දෙසැම්බර් මසට අදාළ වූ ජනවාරි මස ලද ගෙවීම ප්‍රවර්තන වර්ෂයේ වැය ප්‍රතිපාදන භාවිතා කර එම හිමිකම් නිරවුල් කළ බැවින් බැරකම් ලේඛනයේ ඇතුළත් කර නොමැත. එසේ වුවද පෙන්වා දී ඇති පරිදි බැරකම් ලේඛනයට ඇතුළත් කර කටයුතු කිරීමට නිලධාරීන්ට උපදෙස් ලබා දුන් බව දක්වා තිබුණි. | රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ උපදෙස් පරිදි බැඳීම් හා බැරකම් හෙළිදරව් කළ යුතු වීම. |

iii යටතේ ඇති බැදීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශයෙහි හෙළිදරව් කර නොතිබුණි.

## 2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීති, රීති හා රෙගුලාසි වලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | **නීති, රීති හා රෙගුලාසි වලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| (අ) | මුදල් රෙගුලාසි 880 හා 891(i) | රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනතට අනුව ඇප තැබිය යුතු සියළුම නිලධාරීන් විසින් ඇප තබන බවට වග බලාගනු සඳහා කටයුතු කළ යුතු විය. ඇප තැබීමට අවශ්‍ය සියළුම නිලධාරීන්ගේ නම් ඇතුලත් ඇප ලේඛනයක්, එක් එක් දෙපාර්තමේන්තු වෙහි ප්‍රධාන කාර්යාලයේ වඩාත් මැනවින් වූ අකාරාදි ක්‍රමයට පිළියෙල කොට | දැනට අග්‍රාමාත්‍ය කාර්යාලයේ ඇප ලේඛනයක් නඩත්තු කරන අතර ඉදිරියේ දී ඇප තැබිමට අවශ්‍ය සියළුම නිලධාරීන්, මුදල් රෙගුලාසි 891(i) ප්‍රකාරව ඇප තැබීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | මුදල් රෙගුලාසි විධිවිධාන වලට අනුව කටයුතු කළ යුතුවීම. |

| | | | | |
|---|---|---|---|---|
| | | පවත්වාගෙන යා යුතු වුවත් එම ලේඛණය යාවත්කාලීන කර පවත්වාගෙන නොතිබුණි. | | |
| (ආ) | 2022 දෙසැම්බර් 13 දිනැති අංක 2022/05 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝප දේශයේ හි 8.3 ඡේදය හා අංක 2020/02 රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ යේ ඡේද අංක 10.1 | සියළුම වාර්තාකරණ ආයතන විසින් තැන්පතු සඳහා සැසඳුම් ප්‍රකාශයක් පිළියෙල කළ යුතු අතර, එම සැසඳීම් ප්‍රකාශයේ පිටපතක් 2023 පෙබරවාරි 28 වන දින හෝ ඊට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි. | රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ 2020/02 ප්‍රකාරව තැන්පතු සම්බන්ධයෙන් සැසඳුම් ප්‍රකාශය 2023.02.17 දින රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත යොමුකර ඇතත් එහි පිටපතක් ජාතික විගණන කාර්යාලය වෙත යොමු කිරීමට අතපසු වී ඇති බව දන්වා තිබුණි. | රාජ්‍යගිණුම් මාර්ගෝපදේශය හා චක්‍රලේඛ උපදෙස් පරිදි කටයුතු කළ යුතු වීම. |

## 2.4 රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් බී ගිණුම

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 දෙසැම්බර් 31 දිනට රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් “බී” ගිණුම වාර්ෂික සැසඳුම් ප්‍රකාශයේ අවසාන කේවල ශේෂය | ණය ලබා දීම් හා ආපසු අයකර ගැනීම් වලට අදාළව පරිගණකගත ලේඛනයක් නඩත්තු කරනු ලබන බවත් එම ලේඛනයට අනුව 2022.12.31 දිනට | උපයෝගී ලේඛන යාවත්කාලීන කර පවත්වා ගත යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | රු.50,086,632 ක් වූ අතර සාමාජික ණය ලේඛනයේ අවසාන ශේෂය රු.49,509,284 ක් වූයෙන් රු.577,348 ක නොසැසඳීමක් නිරීක්ෂණය විය. | සැසඳුම් ප්‍රකාශයේ 3.1 ලේඛනය අනුව ශේෂයන් නිවැරදි බවත් සාමාජික ණය ලේඛනයන්හි නිරීක්ෂණය අනුව පෙන්වා දී ඇති රු.577,347.84ක වෙනස හඳුනා ගෙන එය නිවැරදි කරන ලද බවත් ඉදිරියේදී සාමාජික ණය ලේඛනය නිසි පරිදි යාවත්කාලීන කිරීමට නිලධාරීන්ට උපදෙස් ලබා දුන් බව දන්වා තිබුණි. | |
| (ආ) | 2022 සැප්තැම්බර් මාසයේදී සේවය අතහැර ගොස් ඇති නිලධාරියෙකුගේ රු.191,602 ක ආපදා ණය මුදලක් විගණිත දිනය වන විට අයවිය යුතුව තිබුණි. | සේවය අතහැර ගොස් ඇති සේවක මහතකු වෙත 2022.09.21 දින සේවය අතහැර යාමේ ලිපියක් නිකුත් කර ඇති බවත් එමගින් සියළුම ගෙවිය යුතු ණය ගෙවා දැමිය යුතු බවට දැනුම් දුන් බවත් නැවත 2023.02.15 දිනද ඔහුට අදාළ ණය මුදල් ගෙවන ලෙස දන්වා, අවශ්‍ය ක්‍රියාමාර්ග ගත් බව දන්වා තිබුණි. | හිඟ ණය මුදල් කඩිනමින් අය කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ඇ) | විශ්‍රාම ගිය නිලධාරීන් 5 දෙනෙකුගෙන් එකතුව රු.1,034,577 ක ණය මුදලක් 2022 දෙසැම්බර් 31 දිනට අයවීමට තිබුණු බව නිරීක්ෂණය විය. | 2022 දෙසැම්බර් 31 දිනට විශ්‍රාම ගිය නිලධාරින් 5 දෙනාට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙතින් ප්‍රතිපාදන නිදහස් කිරීමක් සිදුකර නොමැති බවත් ප්‍රතිපාදන නිදහස් කල විගස එම ණය අයකර ගැනීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | විශ්‍රාමික නිලධාරීන්ගෙන් හිඟ ණය මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

2022 වර්ෂයට අදාලව අග්‍රාමාත්‍යවරයාගේ උපදේශන හා මාර්ගෝපදේශ යටතේ විවිධ ක්ෂේත්‍රයන්ට අදාලව පවත්වන ලද රැස්වීම් හා සාකච්ඡා 95ක් වන අතර එයින් එළැඹි තීරණ / පසුවිපරම් කළ කරුණු 355ක් විය. තවද සිදුකළ ශක්‍යතා අධ්‍යන සංඛ්‍යාව 19ක් ලෙස කාර්යසාධන වාර්තාවෙන් තොරතුරු ඉදිරිපත්කර තිබුණි. උක්ත කාර්යසාධන වාර්තා වලට අදාල පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | | | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | ඒකාබද්ධ වාණිජ මණ්ඩල, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක අංශ හා ඇඟළුම් කර්මාන්ත නියෝජිතයන් සමග රටේ පවතින ආර්ථික තත්ත්වය හා ගැටළු පිළිබඳ 2022 වර්ෂයේදී පවත්වන ලද රැස්වීම් 03 කට අදාල සාකච්ඡා කළ කරුණු සම්බන්ධයෙන් 2022 දෙසැම්බර් 31 දින වන විටත් ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව නිරීක්ෂණය නොවීය. | **රැස්වීම**<br><br>1. ඒකාබද්ධ වාණිජ මණ්ඩල සමඟ සාකච්ඡාව<br><br>2. කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක අංශයේ නියෝජිතයන් සමඟ පැවති සාකච්ඡාව<br><br>3. ඇගළුම් කර්මාන්තය පිළිබඳ සාකච්ඡාව | **පැවැත් වූ දිනය**<br><br>2022.06.02<br><br>2022.06.23<br><br>2022.07.05 | **පැහැදිලි කිරීම**<br><br>මෙම රැස්වීම් හිටපු අග්‍රාමාත්‍යවරයා 2022.05.12 දින පත්වීමෙන් පසු එවකට පැවති අර්බුදකාරී තත්ත්වයන්ට මුහුණ දීම සඳහා කඩිනම් තීරණ ලබා ගැනීමේ අරමුණින් පවත්වන ලද අතර, එහි ප්‍රතිඵලයන් ලෙස රටේ දෛනික ජන ජීවිතය නිසි පරිදි පවත්වා ගැනීමට යම්තාක්දුරකට හැකිවූ බවත් මෙම රැස්වීම්වල එළැඹි තීරණය නොමැති අතර, ඒ බව 2022 අග්‍රාමාත්‍ය කාර්යාලීය කාර්ය සාධන වාර්තාවේ පැහැදිලිව දක්වා ඇති බවත් ඒ අනුව එළැඹි | රැස්වීම් හා සාකච්ඡා වලදී එළඹි තීරණ පිළිබඳ පසු විපරම් සිදු කිරීම් කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | | තීරණ නොමැති බැවින්, පසු විපරම් කටයුතු සිදු කිරීම අවශ්‍ය නොවන බවත් දන්වා තිබුණි. | |
| (ආ) | 2022 ජනවාරි 01 සිට 2022 ජූනි 30 දක්වා පවත් වන ලද රැස්වීම්, සාකච්ඡා හා උත්සව 11 කට අදාලව රැස්වීම් සටහන් අග්‍රාමාත්‍ය කාර්යාලයේ සංවර්ධන අංශ 1 වෙත යොමු කළ ද ඊට අදාල ක්‍රියාමාර්ග සහ පසුවිපරම් කිරීම අදාල අංශය විසින් සිදුකර තිබුණු බව නිරීක්ෂණය නොවීය. | අවස්ථා 9 කදී, අග්‍රාමාත්‍ය කාර්යාලය රැස්වීම පැවැත්වීමට අවශ්‍ය පහසුකම් පමණක් සපයා ඇති බවත් ඉදිරි කටයුතු නාගරික සංවර්ධන අමාත්‍යාංශය, අග්‍රාමාත්‍ය කාර්යාලීය ආගමික කටයුතු අංශය, මහජන උපයෝගීතා කොමිෂන් සභාව, අධ්‍යාපන අමාත්‍යාංශය, ධීවර අමාත්‍යාංශය සිදු කර ඇති බවත් දන්වා තිබුණි. | රැස්වීම් හා සාකච්ඡා වලදී එළඹී තීරණ පිළිබඳ පසු විපරම් සිදු කිරීම් කළ යුතු වීම. |

## 3.2 වත්කම් කළමනාකරණය

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වෙනත් ආයතන සතු වාහන 17 ක් පවරා ගැනීමකින් තොරව අග්‍රාමාත්‍ය කාර්යාලය භාවිතා කර තිබුණි. ඒ අතරින් මාර්ග සංවර්ධන අධිකාරියෙන් අග්‍රාමාත්‍ය කාර්යාලයේ භාවිතයට ගෙන ඇති වාහනයක් 2022 ජනවාරි 14 වන දින අනතුරකට ලක්වී තිබුණු අතර ඒ සඳහා වූ රු.46,600 ක අලාභහානිය සඳහා වූ වන්දි මුදල ශ්‍රී ලංකා රක්ෂණ ආයතනයෙන් ලබාගත් බව විගණනයට තහවුරු නොවීය. | අග්‍රාමාත්‍ය කාර්යාලය වෙත වෙනත් අමාත්‍යාංශ හා ආයතන වෙතින් තාවකාලික පදනම මත ලබාගත් වාහන 17 ක් වේ. ඒ අතර මාර්ග සංවර්ධන අධිකාරිය වෙතින් ලබාගත් වාහන 05 ක් ද ඇත. මාර්ග සංවර්ධන අධිකාරිය වෙතින් ලබාගත් වාහන රක්ෂණය කර ඇත්තේ ඔවුන් විසින්ම වන අතර අනතුරකදී ඒ බව එකී ආයතනය වෙත දැනුම් දෙනු ලැබේ. රක්ෂණ වන්දි ලබාගැනීම මාර්ග සංවර්ධන අධිකාරිය මගින් සිදු වේ. අනතුරට ලක්ව ඇති රථය මාර්ග සංවර්ධන අධිකාරියට අයත් රථයක් බව දන්වා තිබුණි. | බාහිර ආයතන වලින් වාහන පවරා ගැනීමට හා ඒවායේ අනතුරු වාර්තා කිරීමට හා වන්දි අයකර ගැනීමට විධිමත් වැඩ පිළිවෙලක් සකස් කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | අග්‍රාමාත්‍ය කාර්යාලය සතු වාහන 7 ක් අනෙකුත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා කාර්යාල වෙත තාවකාලිකව ලබා දී තිබුණත් මෙම වාහන නැවත අග්‍රාමාත්‍ය කාර්යාලයට පවරා දිය යුතු නිශ්චිත දිනයක් එහි සඳහන් වී නොතිබුණ අතර 2023 අප්‍රේල් 30 විගණිත දිනය වන විටත් මෙම වාහන පවරා දුන් කාර්යාලය තුලම භාවිතා කරමින් පැවතුණි. | එක් රථයක් මේ වන විට ආපසු අග්‍රාමාත්‍ය කාර්යාලය වෙත ලබා දී ඇති බවත් අනෙක් වාහන අවශ්‍යතාවය අනුව එකී කාර්යාල විසින්ම තව දුරටත් භාවිතා කරන බවද ජනාධිපති කාර්යාලයේ සහ අග්‍රාමාත්‍ය කාර්යාලයේ පවතින අවශ්‍යතාවයන් අනුව වරින් වර වාහන හුවමාරු කර ගැනීම සිදුවන අතර ඒ සියල්ල නිසි පරිදි ලේඛණගත කර ඇත. ආපසු භාරදීමට නිශ්චිත දිනයක් දන්වා යැවීමට නිලධාරීන්ට උපදෙස් ලබාදුන් බව දන්වා තිබුණි. | රජයේ දේපල වල ආරක්ෂාව තහවුරු කර ගත හැකි වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතු වීම. |
| (ඇ) | අග්‍රාමාත්‍යවරයාගේ ආරක්ෂිත රථ පෙළට ඇතුළත් බෙන්ස් කාර් 3 ක් 2023 අප්‍රේල් දක්වා ලියාපදිංචි කර නොතිබුණ අතර ඒවායින් එක රථයක් රක්ෂණය කර නොතිබුණ බව ද නිරීක්ෂණය විය. | මුල් කාලීනව ආරක්ෂක හේතූන් මත අග්‍රාමාත්‍යවරයා වෙත වෙන්කර ඇති ඇතැම් නිල වාහන ලියාපදිංචි කර නොමැති බවත් මෑත කාලීනව මිලදී ගත් වාහන ලියාපදිංචි කර ඇති බවත් A 233259 රථය දැනට ධාවන තත්ත්වයේ නොමැති අතර ධාවන තත්ත්වයට පත්කළ පසුව රක්ෂණය කිරීමට කටයුතු කරනු ලබන බව දන්වා තිබුණි. | රජයේ දේපල වල අයිතිය හා ආරක්ෂාව තහවුරු කර ගත හැකි වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතු වීම. |
| (ඈ) | වෙනත් ආයතන වලට වාහන මුදා හැරීම සම්බන්ධයෙන් විගණනයට ඉදිරිපත් වූ තොරතුරු අනුව ජනාධිපති කාර්යාලයෙන් වාහන 03 ක් අග්‍රාමාත්‍ය කාර්යාලයට ලබා දී ඇති බව දන්වා තිබුණ ද අග්‍රාමාත්‍ය කාර්යාලයේ වාර්තා අනුව ජනාධිපති කාර්යාලයෙන් වාහන 04 ක් ලැබී තිබුණ බවත් අදාල වාහන අංක ද එකිනෙකට නොසැසඳෙන බවත් නිරීක්ෂණය විය. | CAV 8103 වෙඩි නොවදින රථය ජනාධිපති කාර්යාලය වෙතින් තාවකාලිකව වෙන් කර දෙන ලෙස ඉල්ලා ඇත. අංක CAC – 4469 දරණ රථය මෙතෙක් අග්‍රාමාත්‍ය කාර්යාලය වෙත ලබා දී නොමැත. A233364 රථය අග්‍රාමාත්‍ය කාර්යාලය භාවිතා කරන නමුත් මෙතෙක් ලිඛිතව ඒ බව දන්වා එවා නොමැති බව දන්වා තිබුණි. | රජයේ දේපල වල අයිතිය හා ආරක්ෂාව තහවුරු කර ගත හැකි වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතු වීම. |

## 3.3 පාඩු හා හානි

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 ජූලි 09 දින රටේ ඇති වූ කළබලකාරී තත්ත්වය හේතුවෙන් වෙඩි නොවදින රථයකට සිදුව ඇති හානිය විගණිත දිනය වූ 2023 මාර්තු 29 දිනය දක්වා ගණන් බලා නොතිබුණි. රු.මිලියන 263 ක රක්ෂණ ආවරණයෙන් රු.මිලියන 200 ක මුදලක් පමණක් ආවරණය කිරීමට ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් සමාගමෙන් අනුමත කර තිබුණි. අලුත්වැඩියාවට අවශ්‍ය අමතර කොටස් රට තුළ නොමැති වීම නිසා මාස 09 කට ආසන්න කාලයක් එම රථය ගර්හිත තත්ත්වයේම පවතී. | වෙඩි නොවදින රථයට රක්ෂණ ආවරණය රු.මි. 263 ක් වන අතර, රක්ෂණ ප්‍රතිලාභ ලබාගැනීමේදී වෙඩි නොවදින ආරක්ෂිත රථයක් වන බැවින් ගර්හිත රථය රක්ෂණ සමාගම වෙත ලබා නොදීම නිසා රක්ෂණ ප්‍රතිලාභ ලෙස රු.මි. 200 ක් ලබා දී තිබූ බවත් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව රථය භාරගත් බැවින් හා පොලිස් පැමිණිල්ලක් නොමැති බැවින් ප්‍රාරම්භක වාර්තාව ප්‍රමාද වී ඇති බවත් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට අනුව හානිය රු.මි. 197 ක් වන අතර යාන්ත්‍රික ඉංජිනේරු නිර්දේශ මත මේ හා සමාන අනෙක් වෙඩි නොවදින රථය සඳහා අමතර කොටස් අවශ්‍ය අවස්ථාවන්වලදී ලබා ගැනීම සඳහා ගර්හිත රථය ආරක්ෂිතව අග්‍රාමාත්‍ය කාර්යාලය තුල රඳවා ඇති බවත් සඳහන් කර තිබුණි. | අලාභහානි ප්‍රතිපූර්ණය කර ගැනීමට / නිරවුල් කර ගැනීමට කඩිනමින් කටයුතු කළ යුතු වීම. |
| (ආ) | මෝටර් රථයකට 2022 මැයි 10 දින රු.874,586 ක අලාභහානියක් සිදුව ඇති අතර එම අලාභහානිය සම්පූර්ණයෙන්ම රක්ෂණ ආයතනය විසින් ආවරණය කළ බවට ලිඛිත සාක්ෂි ගොනුවේ ඇතුළත් කර නොතිබුණි. මෙම රථය අළුත්වැඩියාවට අවශ්‍ය අමතර කොටස් මිලදී ගැනීමට අදාල බිල්පත් පිළිගත නොහැකි බවට රක්ෂණ සමාගම දැනුම් දී | රථයේ දේශීය නියෝජිත ඉදිරිපත් කර ඇති ඇස්තමේන්තුව මිල අධික බැවින් අග්‍රාමාත්‍ය කාර්යාලයේ ලියාපදිංචි ගරාජයකින් ඇස්තමේන්තුවක් ලබාගෙන අදාල අලුත්වැඩියාව සිදු කරගෙන ඇති බවත් රක්ෂණ ආයතනයෙන් ලැබූ මුදල ප්‍රමාණවත් නොවන බැවින් මුදල වැඩි කර දෙන ලෙස ගරාජය විසින් රක්ෂණ ආයතනයෙන් ඉල්ලා ඇති අතර අදාල ලිපි ලේඛණ මේ වන විට ගොණු ගත කර ඇති බවත් රථය මේ වන විට අලුත්වැඩියාව නිම කර ධාවනයෙහි යොදවා ඇති අතර | අලාභ හා හානි පිළිබඳ නිශ්චය කර ඒවා නිරවුල් කිරීමට විධිමත් පියවර ගත යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | තිබුණි. ඒ අනුව මෙම රථයට සිදුවූ මුළු අලාභය සහ රක්ෂණ සමාගමෙන් ආවරණය කර තිබූ හානියේ ප්‍රමාණය විගණනයේදී අනාවරණය කර ගත නොහැකි විය. | රක්ෂණ සමාගම සහ ගරාජය අතර ගෙවන මුදල සම්බන්ධයෙන් එකඟතාවයක් නොපවතින බව දන්වා තිබුණි. | |
| (ඇ) | 2022 මැයි 24 දින හා 2022 මැයි 31 වන දින සිදුවූ රථ වාහන 2 කට අදාල අනතුරු, හානි පාඩු ලේඛනයේ දක්වා තිබුණත් කාර්යාලයේ ලිපිගොනු අංක PMO/ADM/02/03/2101 ගොනුවට අනුව මෙම අනතුරු පිළිබඳව විධිමත් පරීක්ෂණයක් සිදු කළ බවට විගණනයට තහවුරු කරගත නොහැකි විය. | KS – 2101 සහ CAR – 2957 රථ දෙක සඳහාම මු.රෙ. 104 පරීක්ෂණ ආරම්භ කර ඇති බව දන්වා තිබුණි. | අලාභ හානි පිළිබඳ මුදල් රෙගුලාසි වලට අනුව කටයුතු කිරීම කඩිනම් කළ යුතු වීම. |
| (ඈ) | 2022 දෙසැම්බර් 01 දින අනතුරට පත් රථයකට අදාල ව රු.129,100 ක හානියක් වාර්තාවී තිබුණි. එම මුදල රක්ෂණ සමාගමෙන් ආවරණය වී ඇති බවට අලාභහානි ලේඛනයේ සඳහන් වුවද එය තහවුරු කර ගැනීමේ සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය. | රක්ෂණ සමාගම යටතේ ලියාපදිංචි ගරාජයක රථයේ අලුත්වැඩියාවන් නිමකර දැනට ධාවනයෙහි යොදවා ඇති බවත් මු.රෙ. 104 (3) අනුව ප්‍රාරම්භක වාර්තාව ලබා දී ඇති අතර ගෙවීම් විස්තර මෙතෙක් කාර්යාලය වෙත ලබා දී නොමැති බවත් දන්වා තිබුණි. | මුදල් රෙගුලාසි පරිදි කටයුතු සිදු කර සියළු තොරතුරු ගොනුගත කළ යුතු වීම. |
| (ඉ) | මු.රෙ.104(1) ප්‍රකාරව අලාභය සිදු වූ දිනයේ සිට තුන් මසක් ඇතුළත පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වුවත් අලාභහානි වටිනාකම එකතුව රු.203,181,631 ක් වූ 2022 වර්ෂයේ සිදුවී ඇති වාහන අනතුරු 08 ක් සම්බන්ධයෙන් 2023 අප්‍රේල් 17 විගණිත දිනය | 2022 වර්ෂයේදී සිදු වූ දේශපාලන වෙනස්වීම මත ඇතිවූ පරිපාලන ව්‍යුහය වෙනස්වීම හේතුවෙන් මු.රෙ. 104 පරීක්ෂණ සඳහා පත්කළ නිලධාරීන්ගේ ස්ථාන මාරුවීම් සිදු වී ඇති අතර, නැවත එම කමිටු සඳහා නිලධාරීන් පත් කිරීමට කටයුතු යොදා ඇති බවත් දන්වා තිබුණි. | අලාභ හා හානි පිළිබඳ මුදල් රෙගුලාසි වලට අනුව කටයුතු කිරීම කඩිනම් කළ යුතු වීම. |

වන විටත් එම වාර්තා ඉදිරිපත් කර නොතිබුණ බව නිරීක්ෂණය විය.

## 3.4 2022 වර්ෂයේ රට තුළ පැවති කළබලකාරී තත්ත්වයන් මත සිදුවූ අලාභහානි

2022 වර්ෂයේ අවස්ථා ගණනක දී ඇතිවූ කළබලකාරී තත්වයන් මත අග්‍රාමාත්‍ය කාර්යාලයට හානි සිදුවී තිබුණු අතර ඊට අදාල විගණනයට ඉදිරිපත් වූ තොරතුරු වලට අදාල ව පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කළබල හේතුවෙන් අග්‍රාමාත්‍ය කාර්යාලයට සිදු වී ඇති මුළු හානිය රු.111,043,124 ක් බව 2023 අප්‍රේල් 21 දිනැති අංක PMO/FIN/01/13/01/01/2023 දරන ලිපිය මගින් අග්‍රාමාත්‍ය කාර්යාලය විසින් විගණනයට වාර්තා කර තිබුණි. මෙම හානි සම්බන්ධයෙන් මු.රෙ. 103 - මු.රෙ.104 පරිදි කටයුතු කිරීම පිළිබඳ තොරතුරු 2023 අප්‍රේල් 28 විගණිත දිනය වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණ අතර මෙම හඳුනාගත් අලාභ හානි මූල්‍ය ප්‍රකාශන වල අනාවරණය කර නොතිබුණි. | 2022.05.09 දින මහජන සම්බන්ධතා අංශයේ හා අරලියගහ මන්දිරයේ දේපළ වලට සිදු වූ අලාභ හානි සම්බන්ධයෙන් කොල්ලුපිටිය පොලිස් ස්ථානයේ පැමිණිලි සිදු කළ බවත් නැති වූ භාණ්ඩ සම්බන්ධයෙන් පූර්ණ වාර්තාව ලබා ගැනීමත් මුදල් රෙගුලාසි 104(3), 104(4) හා මුදල් රෙගුලාසි 109ට අනුව හානි හා පාඩු පොත්වල ලියාහැරීම සඳහා පොලිස් වාර්තාව කොල්ලුපිටිය පොලිස් ස්ථානයෙන් ඉල්ලා ඇති බවත් 2020.08.28 දිනැති අංක 01/2020 රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 2.1 ප්‍රකාරව වංචාවන් හා පවතින ක්‍රමයේ දෝෂයක් නොවන කල්හි රු. මිලියන 05 නොඉක්මවන හානි සම්බන්ධයෙන් කටයුතු කිරීමේ බලය ප්‍රධාන ගණන්දීමේ නිලධාරීයාට බලය පවරා ඇති බැවින් පොලිස් වාර්තා ලැබුණු පසු ඉදිරි කටයුතු සිදු කරන බවත් දන්වා තිබුණි. | අලාභ හානි පිළිබඳ මුදල් රෙගුලාසි වලට අනුව කටයුතු කිරීම කඩිනම් කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2022 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව භාණ්ඩාගාර 66 ආකෘතිය හා කළබල හේතුවෙන් අලාභහානි සිදුවූ බවට හඳුනාගත් බඩු ලැයිස්තුව අතර භාණ්ඩ වර්ග 13 ක වෙනස්කම් පැවතුණ අතර 2022 භාණ්ඩ සමීක්ෂණ වාර්තාවට අනුව කළබල හේතුවෙන් හානි වූ භාණ්ඩ ලෙස හඳුනාගත් භාණ්ඩ වර්ග 27 ක් කළබල හේතුවෙන් හානි වූ භාණ්ඩ පිළිබඳ අග්‍රාමාත්‍ය කාර්යාලයෙන් සපයන ලද වාර්තාවේ ඇතුළත් වී නොතිබුණ බව නිරීක්ෂණය විය. | 2022.07.09 දින අරගලකාරී තත්වය නිසා හානි වූ භාණ්ඩ 2022.08.03 දින හඳුනාගත් අතර පොලිස් පැමිණිල්ලේද ඇතුලත් කර ඇති බවත් එම අවස්ථාවේ හානි වූ උපකරණ පමණක් හඳුනා ගත් බවද එම භාණ්ඩ හඳුනා ගැනීමේදී රස පරීක්ෂණ වාර්තා ලබා ගන්නා තෙක් හා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ඇඟිලි සලකුණු ලබා ගන්නා තෙක් සමහර කාර්යාල වසා තැබීම නිසා හානි වූ උපකරණ හඳුනා ගැනීම ගැටලු සහගත තත්වයකට පත්ව තිබූ බවත් අරගලය සම්බන්ධයෙන් 2023.04.01 දිනැති ලිපිය මඟින් ප්‍රධාන ගණකාධිකාරී යොමු කර ඇත්තේ මු.රෙ. 104 අනුව සකස් කරන ලද අවසන් වාර්තාවේ නැති වූ උපකරණ සමඟ අදාල ගොඩනැගිලි අළුත්වැඩියා වියදම් සමඟ වන ඇස්තමේන්තුගත වාර්තාව බව සඳහන් කර තිබුණි. | හානිවීම් හා අලාභ පිළිබඳ විස්තර නිවැරදි ලෙස ලේඛනගත කළ යුතු වීම. |
| (ඇ) | කළබලකාරී තත්ත්වය හේතුවෙන් භාණ්ඩ වර්ග 20 ක් අස්ථානගත වී ඇති බවට අග්‍රාමාත්‍ය කාර්යාලය ඉදිරිපත් කළ වාර්තාවේ සඳහන් වුවත් 2022 වර්ෂය සඳහා සිදු කරන ලද භාණඩ සමීක්ෂණයේදී ඒ බව හඳුනාගෙන නොතිබුණි. | නිවැරදි කිරීමට සටහන් කර ගන්නා ලද බව දන්වා තිබුණි. | බඩු වට්ටෝරු පොත් හා භාණ්ඩ සමීක්ෂණ වාර්තා නිවැරදිව සම්පූර්ණ කළ යුතුවීම. |

## 4 කළමනාකරණ දුර්වලතා

| | විගණන නිරීක්ෂණය | ගණකාධිකාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 අප්‍රේල් 26 දිනැති අංක 03/2022 දරන ජාතික අයවැය චක්‍රලේඛ ප්‍රකාරව රාජ්‍ය වියදම් ඉතා අත්‍යාවශ්‍ය සේවාවන්ට පමණක් යොදාගත යුතු බවත්, ගොඩනැගිලි ඉදිකිරීම් හා කුළියට ගැනීම නැවැත්වීම දැඩිව අනුගමනය කළ යුතු බවත්, සඳහන් කර තිබියදීත් අග්‍රාමාත්‍ය කාර්යාල නිල නිවසේ නඩත්තු හා අළුත්වැඩියා සඳහා 2022 වර්ෂයේ දී රු.මිලියන 182 ක් වැය කර තිබුණු අතර 2021 වර්ෂයේ දී ද රු.මිලියන 58 ක් වැය කර තිබුණු බව තවදුරටත් නිරීක්ෂණය විය. | හිටපු අග්‍රාමාත්‍ය පස්වන විධායක ජනාධිපතිතුමන්ගේ නිල නිවසේ නවීකරණ කටයුතු ශ්‍රී ලංකා නාවික හමුදා ශ්‍රම දායකත්වය යටතේ 2021 වර්ෂයේදී ආරම්භ කරනු ලැබුවේ 2021.01.05 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශයෙන් ලද අනුමැතිය මතයි. ඒ අනුව 002-01-01-0-2001 වැය විෂය යටතේ රු.මිලියන 180ක ප්‍රතිපාදන වාර්ෂික අයවැයෙන් වෙන් කර දී තිබූ බවත් වැඩ අවසන් කිරීම සඳහා ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවූ බවත් එම හේතුව මත අවසන් අදියරේ පැවති නිල නිවසේ නවීකරණ කටයුතු අවසන් කිරීම සඳහා ජාතික අයවැය දෙපාර්තමේන්තුවෙන් රු.මි. 300 ක අතිරේක ප්‍රතිපාදන ලබා ගැනීමෙන් අනතුරුව බැඳීම් ඇති කර ගෙන මෙය අවසන් කිරීමට 03/2022 චක්‍රලේඛයට අනුකූලව කටයුතු කරනු ලැබූ බවත් එසේ වුවද වාර්ෂික ප්‍රතිපාදන සංශෝධනය කිරීම තුළ උක්ත වැය විෂය යටතේ ප්‍රතිපාදන රු. මිලියන 190 දක්වා නැවත සීමා කිරීම හේතුවෙන් රු. මිලියන 04 ක වැය ප්‍රතිපාදන මෙම වැය විෂයට මාරු කිරීමට සිදුවූ බවත් දක්වා තිබුණි. | ජාතික අයවැය චක්‍රලේඛ උපදෙස් වලට අනුව කටයුතු කළ යුතු වීම. |
| (ආ) | 2022 අප්‍රේල් 26 වන දිනැති රාජ්‍ය අයවැය චක්‍රලේඛ අංක 03/2022 හා එහි xiv පරිච්ඡේදයට අනුව රජයේ වියදම් සීමා කර තිබියදීත් රු.569,344 ක වියදමක් දරමින් අග්‍රාමාත්‍යතුමාගේ පාර්ලිමේන්තු | ගරු අග්‍රාමාත්‍යතුමාගේ පාර්ලිමේන්තු කතා ඇතුළත් කෘතියේ පිටපත් 197 මාධ්‍ය හා සන්නිවේදන අධ්‍යක්ෂතුමා භාරයේ තබා ගෙන ඇත්තේ එම කෘතියේ සියළු වෙළුම් සමඟ දොරට වැඩුම 2023 අගෝස්තු මාසයට යොදා ගෙන ඇති බවත් ඒ සමඟ බෙදා දීමේ කටයුතු සිදු කිරීමට සැලසුම් | ජාතික අයවැය චක්‍රලේඛ උපදෙස් වලට අනුව කටයුතු කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| ප්‍රකාශ ඇතුළත් කෘතියේ පළමු වෙළුම මුද්‍රණය කර තිබුණු අතර එහි පිටපත් 197 ක් 2023 අප්‍රේල් 21 දක්වාත් බෙදාහැර නොතිබුණු බව විගණනයට නිරීක්ෂණය විය. | කර ඇති බවත් දන්වා තිබුණි. | |

## 5 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ අනුමත තනතුරු සංඛ්‍යාව 561 ක් වූ අතර ඉන් තනතුරු 286 ක් පුරප්පාඩුව පැවතුනි. එම පුරප්පාඩු වලින් 30 ක් ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු විය. | වියදම් කළමනාකරණය කිරීම මැයෙන් වූ චක්‍රලේඛය ප්‍රකාරව කාර්ය මණ්ඩල අනුමත සංඛ්‍යාවක් මත අග්‍රාමාත්‍ය කාර්යාල කටයුතු ඉටු කිරීමට ගත් ක්‍රියාමාර්ග අනුව ගරු අග්‍රාමාත්‍යතුමා තම අනුමත කාර්ය මණ්ඩලය 168 සිට 18 දක්වා 2022 සැප්තැම්බර් මස වන විට අඩු කළ බවත් ඊට සාපේක්ෂව මෙහෙයුම් කාර්ය මණ්ඩලයද අඩු කිරීම තුළින් අවම පිරිවැයකින් අග්‍රාමාත්‍ය කාර්යාලය පවත්වාගෙන යාමට කටයුතු කරන ලද බව දන්වා තිබුණි. | පුරප්පාඩු පිරවීම හෝ රාජ්‍ය සේවය කාර්යක්ෂම හා ඵලදායී ලෙස පවත්වා ගැනීමට හැකිවන පරිදි අනුමත කාර්යය මණ්ඩලය ප්‍රතිශෝධනය කළ යුතු වීම. |